IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය

## මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලා අංක 09

## ප්‍රථම සෙමෙස්තර පරීක්ෂණය

(පවත්වන ලද්දේ 2019 නොවැම්බර්)

## DDAMS 1001 – මත්ද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය භාවිතය හැඳින්වීම

උපදෙස්

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ. තුනයි (03).

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) හා පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නයක් හෝ පිටුවක් මුද්‍රණය වී නොමැති නම් ඒ බව වහාම ශාලාධිපති වෙත දැනුම් දෙන්න.

07. i. පහත සඳහන් කරුණු නිර්වචනය කරන්න.

a. ඖෂධ (Drug)

(ලකුණු 02)

b. මත්ද්‍රව්‍ය (Drugs of Abuse)

(ලකුණු 04)

c. නව මනෝ කාරක ද්‍රව්‍ය (New Psychoactive Substances)

(ලකුණු 02)

d. පූර්වජ රසායනික ද්‍රව්‍ය (Precursor Chemicals)

(ලකුණු 02)

(ලකුණු 10)

ii. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තකු සතු ලක්ෂණ පිළිබඳ විද්‍යාත්මක පැහැදිලි කිරීමක් සහිතව විස්තර කරන්න.

a. මත්ද්‍රව්‍ය සරණතාවය/යැපීම සඳහන් කර තිබීම

(ලකුණු 04)

b. විරමණ ලක්ෂණ සඳහන් කිරීම

(ලකුණු 02)

c. ඔරොත්තුව සඳහන් කිරීම

(ලකුණු 02)

d. මත්ද්‍රව්‍ය ගැනීමට ඇති කැමැත්ත/අත්‍යවශ්‍ය බව සඳහා වන චර්යාත්මක වෙනස්වීම් විස්තර කිරීම

(ලකුණු 02)

**(මුළු ලකුණු 20)**

08. i. මත්ද්‍රව්‍ය වර්ගීකරණය කරන ක්‍රමවේද මොනවාද?

(ලකුණු 06)

ii. එක් එක් වර්ගීකරණ ක්‍රමවේදයන් උදාහරණ සහිතව විස්තර කරන්න.

a. නිෂ්පාදන ක්‍රම විස්තර කිරීම (ස්වභාවික/අර්ධ කෘතිම/කෘතිම) උදාහරණ සහිතව

(ලකුණු 03)

b. ජාත්‍යන්තර සම්මුතීන් විස්තර කිරීම- (මාදක,මනෝවර්ධක ද්‍රව්‍ය)

(ලකුණු 03)

c. මනෝකාරක බලපෑම් විස්තර කිරීම
(මාදක, අවපීඩක, භ්‍රාන්තිකාරක, උත්තේජක ආදී)

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

******

01. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතයේ විකාශනය සහ වර්තමාන මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවනතා උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. ගෝලීය මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවනතා හා නූතන තාක්ෂණය ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවනතා හා ව්‍යාප්තිය කෙරෙහි බලපාන ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ අවධානය යොමුකරමින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය කිරීම සඳහා ගතයුතු බහුවිධ ප්‍රවේශ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය, නිවාරණය, ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධව ක්‍රියාකරන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහ සිවිල් සමාජයේ භූමිකාව විස්තර කරන්න.

(ලකුණු 20)

05. "මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක සමාජ, දේශපාලන, ආර්ථික, හා සංස්කෘතික යන ක්ෂේත්‍රවලට විහිද යයි" උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. පහත සඳහන් අනු මාතෘකා 04 ක් සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න.

i. මත්ද්‍රව්‍ය එන්නත් කිරීම හා HIV/AIDS ව්‍යාප්තිය (Injecting Drug use & HIV/AIDS)
ii. මත්ද්‍රව්‍ය ඇබ්බැහිය (Drug Addiction)
iii. විෂ මත්ද්‍රව්‍ය/මාදක (Narcotic Drugs)
iv. දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
v. මත්ද්‍රව්‍ය ඇබ්බැහිය හා ඇතිවන ගැටළු
vi. කෘත්‍රිම මත්ද්‍රව්‍ය (Synthetic Drug) (සංශ්ලේෂක ඖෂධය)
vii. හෙරොයින් භාවිතය
viii. ගංජා භාවිතය

(එක් ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් ප්‍රශ්න හතරට ලකුණු 20)